## හඬක් නැති මිනිසුන් වෙනුවෙන් නැගෙන හඬ

# ජන කරළිය

**Dr. Sena Nanayakkara**
B.A. (Hons.), M.A. (Research), Ph.D. (Mass Communication)
Senior Lecturer (Grade I), Department of Humanities,
Rajarata University of Sri Lanka, Mihintale

ශ්‍රී ලාංකේය වේදිකා නාට්‍ය වංශ කතාවේ සුවිශේෂ සන්ධිස්ථාන සලකුණු කෙරෙන අතිශය වැදගත් සංවිධානාත්මක නාට්‍ය කණ්ඩායම් රාශියක් පිළිබඳ අපේ මතකය ඈතට දිවයයි. නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා ඒවායින් සිදු කෙරුණු මෙහෙවර සුවිශාල වෙයි. නමුත්, අද විවිධ සමාජාර්ථික හා දේශපාලන පසුබිම් හේතුකොටගෙන එබඳු අත්දැකීම් දුලබ වන තරම් යැයි කීවොත් එය නිවැරදි ය. එය එසේ වුව ද, ශ්‍රී ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයේ ඉදිරිගමන උදෙසා විශිෂ්ට ශිල්පීය ක්‍රමවේද ගවේෂණය කරමින්, හුදු රසවින්දනයෙන් ඔබ්බට එය ව්‍යවහාරික ලෝකයට මුහුකරන්නට ප්‍රයන්ත දරන සැබෑ කලා ශිල්පීන් සමූහයක් පිළිබඳ මෙලෙස ජන අවධානය යොමු කරවන්නට ලැබීම එක්තරා අතකට අප ලද භාග්‍යය කි.

කලාව හා කලාකරුවා නාමයෙන් මිත්‍යාව වැපිරෙන යුගයක මෙබඳු දේ සඳහා අප ශක්තිය සැපයිය යුතු ය. එසේ නොවන්නේ නම් සැබෑ කලාව ත්, කලාකරුවා හා එහි පරමාදර්ශී පරමාර්ථ ත් ගිලිහීගොස්, අවස්ථාවාදී බඩගෝස්තර කලාව තුළ සියල්ල අතරමං වනු ඇත. එබැවින්, අද අප සැබෑ විශිෂ්ටයින් හඳුනාගත යුතු ය. ඔවුන් සම්භාවනයට ලක්කළ යුතු ය. “ජනකරළිය” ඒ සම්භාවනීය සද්ජන සමූහය යි.

කලාව, විද්‍යාව, දේශපාලනය තුළ හෝ වෙනයම් සමාජ ක්ෂේත්‍රයක් තුළ අනාගත ප්‍රගමනය හෝ අවගමනය රඳා පවත්නේ එහි අරමුණු, ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පදනම් කොටගෙන ය. පනහේ දසකයේ අග භාගයේ සිට ම වේදිකා නාට්‍ය ක්ෂේත්‍රය තුළ එබඳු බොහෝ යහපත් දේ සංවිධානාත්මක ව කණ්ඩායම් ලෙස සක්‍රීය වී ඇත. ආචාර්ය සරච්චන්ද්‍රයන්ගේ “ජන රංග සභාව”,

හෙන්රි ජයසේනගේ "නළු කැල", සුගතපාල ද සිල්වා ගේ "අපේ කට්ටිය", දයානන්ද ගුණවර්ධනගේ "ආධුනික නාට්‍ය සංසදය", ධම්ම ජාගොඩගේ "රංග ශිල්ප ශාලිකාව", ගාමිණී හත්තොටුවෙගමගේ "වීදි නාට්‍යය", පී.ඩී.එල්. පෙරේරාගේ "කලා පෙළ", ප්‍රේමරන්ජිත් තිලකරත්නගේ "හැටතුනේ කණ්ඩායම", ෆිලික්ස් ප්‍රේමවර්ධනගේ "ආලෝක රංග සභාව" ආදිය ඊට සැපයිය හැකි ප්‍රධාන නිදසුන් කිහිපයක් පමණි.

ඒ හැර, රජයේ ලලිත කලායතන නාට්‍ය සංගමය ත්, පේරාදෙනිය විශ්වවිද්‍යාලයීය සිංහල නාට්‍ය සංගමය ත් ආයතනික වශයෙන් සංවිධානාත්මක කාර්යභාරයක් ඉටුකොට ඇත. චිත්‍රසේනගේ "චිත්‍රසේන කලායතනය", සුදාස් මාස්කෝරාලගේ "ප්‍රජා නිකේතනය", සුනෙත් ගෝකුලගේ "ළමා කලා මන්දිරය", සතිස්චන්ද්‍ර එදිරිසිංහගේ "මහජන කලා මණ්ඩලය", වින්සන් බොතේජුගේ "රංගනී කලායතනය" හා අර්නස්ට් මැකින්ටයර්ගේ "ස්ටේජ් ඇන්ඩ් සෙට්" ආදිය ද එබඳු ම පුරෝගාමී නාට්‍ය කණ්ඩායම් සමහරකි. පසුකාලීන ව එබඳු සංවිධානයන් සිය දහස් ගණනින් රටපුරා ව්‍යාප්ත වන්නට විය.

සමාජය සැබෑ ලෙස යහපත් කිරීමේ උත්තුංග අපේක්ෂා සහිත විශිෂ්ට කලාකරුවන් ලෙස මෙරට රසික ජන ආකර්ශනය ලද පරාක්‍රම නිරිඇල්ල හා එච්.ඒ. පෙරේරා නම් වූ නාට්‍යවේදීන් විසින් ආරම්භ කරන ලද "ජන කරළිය" (Theatre of the People) අප සම්භාවනයට ලක්කරන විෂය ක්ෂේත්‍රයෙහි නූතන ලාංකේය පූර්වාදර්ශය යැයි හඳුන්වාදීම අතිශයෝක්තියක් නොවේ.

1974 දී ධම්ම ජාගොඩගේ රංග ශිල්ප ශාලිකාවෙන් රංග චාරිකාව ආරම්භ කොට ආචාර්ය ගාමිණී හත්තොටුවෙගමගේ වීදි නාට්‍යයෙන් ජනතා නාට්‍ය කලාවෙහි අත්පොත් තැබූ පරාක්‍රම නිරිඇල්ලයන් හා එච්.ඒ. පෙරේරා, වේදිකානාට්‍යය සැබෑ ලෙස ජනතාකරණය කිරීමේ ප්‍රායෝගික ක්‍රියාමාර්ග අත්හදා බැලූවන් අතර අපේ යුගයේ පුරෝගාමීහු වෙති. දිවයිනේ ඈත දුරබැහැර පෙදෙස්වල ගැමි ජන නිර්මාණකරුවන් හා ප්‍රේක්ෂකයා දැනුමෙන් අවබෝධයෙන් සන්නද්ධ කරවීම ත්, කලා රසවින්දනය පදනම් කොටගත් පුද්ගල සංවර්ධනය ත් ඔවුන් තුළ වූ සුවිශේෂ ඉලක්ක විය. එපමණක් නොවේ, දසක තුනකට ආසන්න කාලයක් තුළ වැඩෙමින් පැවැති අසමගිය වෙනුවට කල් පවත්නා ස්ථිරසාර වූ වාර්ගික එකමුතුව, ඒ අතර වූ ප්‍රමුඛතම අභිලාෂය යි. මෙකී සකලවිධ චින්තන විපර්යාස හරහා ගොඩනැගෙන සාධාරණ, යුක්තිසහගත, යහපත් මානව සමාජය එහි අග්‍ර ප්‍රාර්ථනය විය.

ඒ අනුව සාමාජිකයින් විසි දෙනෙකුගෙන් යුතුව 2004 ජූලි මස 29 වෙනි දින "ජනකරළිය" ගොඩනැගිණි. එදා සිංහල සාමාජිකයන් දොළොස් දෙනෙක් හා දෙමළ සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත වූ එය සැබෑ වාර්ගික එකමුතුවක් විය. ඒ අනුව, දැනුවත්ව ඒකරාශී කළ බහු වාර්ගික සහභාගීත්වයකින් යුතු ප්‍රථම පූර්වාදර්ශය සැපයීමේ සම්මානනීය ගෞරවය ශ්‍රී ලංකාවේ "ජනකරළිය"ට හිමිවෙයි.

එපමණක් නොවේ, සම්මත සාම්ප්‍රදායයික පින්තූර රාමු වේදිකාව (Prociniam Stage) වෙනුවට සතර දෙසින් ම නාට්‍ය නැරඹිය හැකි නව ඇරීනා සංකල්පයට අනුව (New Arena Concept) නිර්මාණය කෙරුණු රංගෝපක්‍රම භාවිතය, නව නාට්‍ය සම්ප්‍රදායයක් කෙරෙහි වන විශිෂ්ට නිර්මාණාත්මක ප්‍රවේශයක් වෙයි. එය වඩාත් සජීවී ය. සමීප ය. විටෙක ප්‍රේක්ෂකයා ද නාට්‍යයේ භූමිකාවකි. මුදල් ගෙවා ශාලාවක් තුළ ගොනු වූ එක් සමාජ පංතියක් වෙනුවට උස් පහත් බේදයකින් තොර, වාර්ගික වෙනස්කමක් නැති, විවිධ පංතිමය සමාජ මුහුවක් සහිත සැබෑ ප්‍රේක්ෂක ජන සමූහයකට මෙහිදී නාට්‍යය නැරඹිය හැකිවනු ඇත. ප්‍රතිචාරය ද එසේම ය. එය ක්ෂණික ය. අව්‍යාජ ය. එයින් කියැවෙන්නේ අපේ ම ජීවිත ගැන බැවින් එය අපට ආගන්තුක නොවේ. එකී දෘෂ්ටියෙන් ගත්කල ද "ජනකරළිය" සුවිශිෂ්ට වෙයි.

එහි නිර්මාතෘවර නිහඬ උස මිනිසුන් දෙදෙනාගෙන් ආදරණීය එච්.ඒ. පෙරේරා සහෘදයාණන් අද අප අතර නැත. පසුගිය පෙබරවාරි 05 වෙනිදා ඒ විශිෂ්ට කලාකරුවා සදහට ම නිහඬ විය. නමුත්, පරාක්‍රම නිරිඇල්ල සහෘදයාණන් අදත් "නඩේගුරා"ලෙස "ජනකරළිය" මෙහෙයවයි. දිලිප් රෝහණ, අමිත්ත වීරසිංහ, ප්‍රේමතිලක පේරුකන්ද හා රවීන්ද්‍ර මාපිටිගම ඈ නාට්‍යවේදීහු ඊට ශක්තිය සපයති. සැබැවින් ම එය ආස්වාදජනක එහෙත්, අති දුෂ්කර ක්‍රියාන්විතය කි.

සුලබ ව අප දකින සාමාන්‍ය නාට්‍ය කණ්ඩායමකට හෝ නාට්‍ය ක්‍රියාවලියකට වඩා තවත් සුවිශේෂ විශිෂ්ටතා රැසක් අපි මෙහිදී අත්දකින්නෙමු. වඩාත් ස්ථාවර සංචාරක නාට්‍ය කණ්ඩායමක් ලෙස ද, සත්‍ය ලෙස ම බහු වාර්ගික නියෝජනයක් ලෙස ද සක්‍රීය වීම ප්‍රශංසා කටයුතු ය. රටපුරා විසිරී පැතිරී අප්‍රකට ව සිටි සිංහල දෙමළ දක්ෂ තරුණ තරුණියෝ සැබෑ සංවේදී මානවහිතවාදී කලාකාර විශිෂ්ටයින් ලෙස අද පොදුජන ප්‍රේක්ෂකයා අභිමුව සිය ශිල්ප හරඹ පතළ කරති. මම මෙහිදී ඔවුන්ගේ නම් ගම් ස්මරණය කරනුයේ සැබැවින් ම එහි අභිමානය හා ගෞරවය ඔවුන් වෙත කැඳවනු රිසියෙනි.

ජයන්ත මුතුතන්ත්‍රි (ඇඹිලිපිටිය), සුනෙත් ශාන්තප්‍රිය (මොණරාගල), සුමුදු මල්ලවාරච්චි (රත්මලාන), අජන්තන් ශාන්තිකුමාර් (බොගවන්තලාව), රාසයියා ලෝහනාදන් (බොගවන්තලාව), මංජුල රණසිංහ (හුංගම), රොනිකා චාමලී (ගම්පහ), නිශාන්ත කුලරත්න (මහනුවර), ත්‍යාගරාජා සිවනේසන් (බොගවන්තලාව), ස්වර්ණ ශ්‍රී ලිවේරා (කෑගල්ල), පාලිත අබේලාල් (මහනුවර), නයනා මලිතිකුමාරි (බෙන්තර), රුවිනි දිලන්ති (අනුරාධපුර), ටාසන් සැම්පෝල් (ත්‍රිකුණාමලය), සුරේෂ් අසංක (අනුරාධපුර), මුනියන්ඩි කාලිදාස් (නුවර එළිය), රාජේශ්වරන් සත්‍යප්‍රභා (නෝවුඩ්), අමිල දිනේශ් කුමාර (අනුරාධපුර), රන්ජිත් සුමිත් (පුත්තලම), සරත් බානගල (ඇඹිලිපිටිය), සිනෙත් දේවින්ද (පිලියන්දල), බුද්ධික රත්නසේකර (අනුරාධපුර), ශාන්තිනී මල්කාන්ති (නුවරඑළිය), ඉනෝකා ලංකාපුර (තංගල්ල), අරෝෂා තරංගනී (වේයන්ගොඩ), දිනේෂ් කුමාර (තංගල්ල), අසේල චතුරංග (අනුරාධපුර), සෙල්වරාජ් ලීලාවතී (බොගවන්තලාව) හා ක්‍රිෂාන්තන් සොක්කාලිංගම් (ත්‍රිකුණාමලය) යන අය එකී විශිෂ්ටයෝ වෙති.

දුර්භාග්‍ය සම්පන්න යුද්ධයක් අත්විඳි සමාජයක මළ කෑ සිත් පිත් මිනිස්කමින් සෝදාහරින්නට ඔවුන් දරන ප්‍රයත්නය ප්‍රශස්ත ය. නූතනයේ සූරාකන ආත්මාර්ථකාමී සමාජ ආර්ථික හා බඩගෝස්තරවාදී දේශපාලන ක්‍රියාවලිය කෙරෙහි ඔවුන් දක්වන ප්‍රතිචාරය ප්‍රගතිශීලී මෙන් ම නිර්මාණශීලී ය. විචාරශීලී ය. ඒ අනුව, "ජනකරළිය" වූ කලී නිබඳ අප ස්පර්ශ කොට ගන්නා බොරුව, වංචාව හා ව්‍යාජය කෙරෙහි ගතානුගතිකත්වයෙන් මුදවා එය ප්‍රශ්න කිරීමෙහි ලා ජන මනස පොළොඹවන සැබෑ ජනමත මණ්ඩපයක් වෙයි. හඬක් අහිමි ජනතාව වෙනුවෙන් රැව්දෙන ජවසම්පන්න ජන හඬක් වෙයි.

"චරන්දාස්", "සෙක්කුව", "මැටි කරත්තය", "අන්දර මල්" හා "සීතාම්බර පට" ආදී නාට්‍ය නිර්මාණ ඊට සංනිදර්ශන ය. කුමන්ත්‍රණකාරී වංචාකාරී දේශපාලන ක්‍රියාවලියක් හා ඇත්ත කතාකරන ජනතාවාදී හොරෙක් වටා ගෙතුණු අපූර්ව කතා වස්තුවක් "චරන්දාස්" නාට්‍යයට කේන්ද්‍ර වෙයි. ප්‍රකට ඉන්දියානු ජන නාට්‍යකරුවකු වන හබීබ් තන්වීර් ගේ "චරන්දාස් චෝර්" හි අනුවර්තනයක් ලෙස සිංහලෙන් හා දෙමළෙන් ද ඉදිරිපත් කරනු ලැබූ මෙය, 2006 රාජ්‍ය නාට්‍ය උළෙලෙහි දී සිංහල දෙමළ අංශද්වයේ ම හොඳම නාට්‍ය ඇතුළු ප්‍රධාන සම්මාන නවයකින් පිදුම් ලැබී ය.

එසේ ජාතික මට්ටමෙන් පමණක් නොව, ජාත්‍යන්තර තලයේදී ද ප්‍රශස්ත ප්‍රේක්ෂක ප්‍රසාදයක් ඊට හිමි විය. 2008 නවදිල්ලි ජාතික නාට්‍යකලා ඇකඩමිය විසින් පවත්වන ලද භාරත රංගකලා මහෝත්සවය නියෝජනය කිරීම සඳහා "ජනකරළිය" තෝරාගැනීම ම අභිමානයක් නොවේ ද? තමිල්නාඩු ප්‍රාන්තයේ චෙන්නායි හා පොන්ඩිචේරු විශ්වවිද්‍යාලවල ත්, අරන්දක්කම් හා පුදුකුප්පම් ධීවර ගම්මානවලදී ත්, "චරන්දාස්" රඟදැක්වූයේ කලාපීය නව නාට්‍ය සම්ප්‍රදායක් සඳහා අපේක්ෂා සහිතව ය.

"සෙක්කුව" හා "මැටි කරත්තය" ද ජන කරළියෙහි ප්‍රසාද පූර්වක නිර්මාණයෝ ය. 1976 ජාතික නාට්‍ය උළෙලේ විශිෂ්ටතම නාට්‍යය වූ "සෙක්කුව", එස්.ජී. පුංචිහේවාගේ "සෙක්කුව" කෙටිකතාව ඇසුරෙන් නිර්මිත නාට්‍යය කි. ශූද්‍රකගේ "මෘච්ඡකටිකා" සංස්කෘත නාට්‍ය ඇසුරින් පියදාස නිශ්ශංක සූරීන් පරිවර්තනය කළ "මැටිකරත්තය" ජනකරළිය නව නිෂ්පාදනයක් ලෙස කලඑළිබැසීම ප්‍රසාදජනක වෙයි. "සීතාම්බර පට" හා "අන්දරමල්" තුළින් ප්‍රේක්ෂකයා වෙත සම්ප්‍රේෂණය කරනු ලබන කාලීන සමාජ ආවර්ජනය ප්‍රශස්ත ය. මේ සියල්ල සිංහලෙන් මෙන් ම දෙමළෙන් ද ජනකරළිය නිෂ්පාදනයන් ලෙස ප්‍රේක්ෂක ප්‍රසාදයට පාත්‍රව තිබීම සැබැවින් ම අභිමානය කි.

"ජනකරළිය" ජංගම රඟහල ත්, විවිධ වැඩමුළු ස්වරූපයේ සමාජ කාර්යභාරය ත්, කලාපීය නාට්‍ය කණ්ඩායම් ගොඩනැගීම මෙන් ම ප්‍රාදේශීය නිර්මාණකරුවන් කෙරෙහි වේදිකාවේ ඉඩ ප්‍රස්ථා සැලසීම ද අද වන විට ඔවුන්ගෙන් ඉටුකෙරෙන මහඟුතම සමාජ මෙහෙවරයන් වෙයි. ජංගම රඟහල සරල ය. මෙය සවිකිරීම, ගැලවීම, ප්‍රවාහනය හා ශබ්ද පරිපාලනය මෙන් ම

ආලෝකකරණය ද සිදු කෙරෙනුයේ නාට්‍ය ශිල්පීන් විසිනි. පැය දෙකක් බඳු කෙටි කාලයක දී සියල්ල පිළියෙළ කළ හැකි පරිදි වූ එහි තාක්ෂණය වඩාත් සියුම් ය. දුෂ්කරතා බහුල ඈත දුර බැහැර පෙදෙස් වලදී එහි වටිනාකම අපමණ ය.

2005 මාර්තු 20 වෙනිදා කොළඹ 07 නොමැඩ්ස් ක්‍රීඩාංගනයෙන් ප්‍රදර්ශනය ආරම්භ කළ "ජනකරළිය" ඉන් පසුව අනුරාධපුර, කන්තලේ, පුත්තලම, හම්බන්තොට, තංගල්ල, තඹුත්තේගම, පදවිය, මැදවච්චිය, තන්තිරිමලේ, මොනරාගල, හැටන් හා බදුල්ල යන ප්‍රදේශයන් හි සැරිසරා සුවිශාල ප්‍රේක්ෂක ප්‍රතිචාර ලබමින් පසුගිය දා යළිත් අනුරාධපුරයට සේන්දු විය. නාට්‍ය කලාව සාර්ථක ද්විතීයික අධ්‍යාපන මාධ්‍යක් බව ත්, දැනුම ආකල්ප මෙන් ම රුචිකත්වය හා රසවින්දනය ද ප්‍රශස්ත තලයකට කැඳවීමෙහි ලා භාවිත කළ හැකි මහඟු ක්‍රමෝපායයක් බව ත් "ජනකරළිය" මැනවින් ඔප්පුකොට ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශවල පවත්වා ඇති නාට්‍ය වැඩමුළුවලින් කලඑළි දුටු ආධුනික ශිල්පීන් ඊට සාක්ෂි ය.

ඒ හැර වසර පහකට අධික කාලයක් තිස්සේ දිගු වෙහෙසකර චාරිකාවක යෙදෙමින් සමාජය යහපත් කිරීමෙහි ලා ප්‍රයත්න දරන ජනකරළිය ශිල්පීන්ගේ අනාගතය සුරකිනු පිණිස කලාපීය නාට්‍ය කණ්ඩායම් තුනක් ගොඩනැගීම ද එහි මහරු මෙහෙවරකි. අනුරාධපුර, හම්බන්තොට හා නුවරඑළිය යන ප්‍රදේශවල එකී කලාපීය නාට්‍ය කණ්ඩායම් ස්ථාවර කිරීමට මේ වන විට සැලසුම් කෙරෙනු ඇත.

2004 සුනාමි ව්‍යසනයේ දී විපතට පත්වූවනට සොඳුරු සහන කණ්ඩායමක් ලෙස සෞන්දර්යාත්මක කුසලතා නිර්ලෝභී ව කැපකළ ඔවුන්, එවක දකුණේ හා නැගෙනහිර අසරණයින්ගේ සැබෑ සුමිතුරෝ වූ අයුරු අපට මතක ය. ඒ අනුව, ජාති, ආගම්, කුලමල හා පංතිමය තරාතිරම් "ජනකරළිය" ට වලංගු නොවේ. සමාජය මීට වඩා යහපත් කරවීමේ මහඟුතම අභිලාෂයෙන් යුතු ව පරාක්‍රම නිරිඇල්ලයන් ඇතුළු "ජනකරළිය" සහෘද කැල මැයි 01 වනදා සිට වව්නියාව, මන්නාරම හා යාපනය ප්‍රධාන කොටගත් උතුරුකරයේ රංග චාරිකාවෙහි යෙදෙන්නට නියමිතය. ඉන්පසුව, අනුරාධපුරය ඔවුන්ගේ ස්ථිර වාසභූමිය වනු ඇත. අප ඔවුනට ශක්තිය සැපයිය යුතු ය. මේ සටහන ඒ විශිෂ්ටයින් උදෙසා පිදෙන අංශුමාත්‍රික උපහාරයක් පමණි.

**ආචාර්ය සේන නානායක්කාර**
"අසූවේ අපි" වෙනුවෙන්